# යුක්තිය හා සාධාරණත්වය ඉල්ලා පෙළගැසෙමු!



# ඉෂාරා මධුෂානි

## අනුස්මරණ උත්සවය හා වීදි මෙහෙයුම

## අගෝස්තු 12

වෙන්නප්පුව තල්දෙක මහා විද්‍යාලයේ උප ශිෂ්‍ය නායිකාව ලෙස සිටි 16 හැවිරිදි ඉෂාරා මධුෂානි 2007 මාර්තු 27 වන දින අවාසනාවන්ත ලෙස මිය ගියා. මෙම මරණය සියදිවි නසාගැනීමක් බවයි මීගමුව මූලික රෝහලේ අධිකරණ වෛද්‍යවරයා ප්‍රකාශ කර තිබුනේ.

නමුත් ප්‍රදේශ වාසීන්ගේ නොපසුබට උත්සාහය නිසා අධිකරණ නියෝගයකින් නැවතත් ඉෂාරාගේ දේහය 2007 අප්‍රේල් 11 වන දින ගොඩ ගැනුනා. කොළඹ දී පැවැති දෙවැනි මරණ පරීක්ෂණය දී මෙය මිනීමැරමක් විය හැකි බවට වාර්තා වූ නිසා, මාරවිල මහේස්ත්‍රාත් අධිකරණය විසින් ඉදිරි විමර්ෂන කටයුතු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පවරනු ලැබුවා.

**ඉෂාරාගේ මරණය සම්බන්ධව**
**වෙන්නප්පුව පොලීසිය, අධිකරණ වෛද්‍ය නිළධාරීයා කටයුතු කළ ආකාරය නිවැරදිද?**

ප්‍රදේශවාසීන්ගේ උත්සාහය නිසා වැළලෙන්නට ගිය අපරාධයක සුල මුල දැන් අනාවරණය වෙමින් තිබේ. මෙම සිද්ධිය අත්දැකීමකට ගෙන ඉදිරියේ දී මෙවැනි අයුක්ති සහගත ක්‍රියාවන්ට එරෙහි වීමට ප්‍රදේශවාසීන් මානව හිමිකම් ආරක්ෂක ඒකකයන් ප්‍රදේශයේ ගොඩනගා ඇත.

ඉෂාරාගේ 17 වන උපන් දිනය නිමිත්තෙන් ඇය අනුස්මරණය කිරීම පිණිස වැඩසටහන් මාලාවක් අගෝස්තු 12 වන දින යොදාගෙන තිබේ. එදින ඇය වෙනුවෙන් විශේෂ දිව්‍ය මෙහෙයක් වීදි උද්ඝෝෂණයක් හා අධ්‍යාපන වැඩසටහනක් පැවැත්වීමට කටයුතු යොදා තිබේ.

| | | | |
|---|---|---|---|
| **විශේෂ දේව මෙහෙය** | **- තල්දෙක දේවාස්ථානය** | **උදේ** | **7.30** |
| **වීදි උද්ඝෝෂණය** | **- වෙන්නප්පුව නගරය** | | **10.00** |
| **දානය** | **-** | | **11.30** |
| **අධ්‍යාපන වැඩසටහන** | **- තල්දෙක මහා විද්‍යාලය** | **සවස** | **2.30** |

# ඔබ සැමට ආරාධනා


**වැඩි විස්තර සදහා**

**Rifgt to Life** මානව හිමිකම් මධ්‍යස්ථානය,
නො. 555, කොළඹ පාර, කටුනායක
දුරකතන 031 4870308

**වෙන්නප්පුව මානව හිමිකම් ඒකකය**
තල්දෙක, වෙන්නප්පුව
දුරකතන 031 2250080

මහජන අවධානය පිණිසයි...

# ඉෂාරාගේ මරණය



## හදිසි අනතුරකින් සිදුවූවක්ද..?
## සිය දිවි නසා ගැනීමක්ද..?
## මිනී මැරුමක්ද..?

වෙන්නප්පුව, තල්දෙක විසූ 16 හැවිරිදි ඉෂාරා මධුෂාණි වෙන්නප්පුව තල්දෙක මහා විද්‍යාලයේ උප ශිෂ්‍ය නායිකාව. ඇයගේ මරණය සිදුවූයේ 2007 මාර්තු 27 දින. මරණයට හේතුව තියුණු පිහියකින් ඇයගේ උදර ප්‍රදේශය කැපී තිබීම.

තල්දෙක විද්‍යාලයේ දීප්තිමත් ශිෂ්‍යාවක් වූ නිසාත්, ගම්වාසීන්ගේ හිත් දිනාගත් දැරියක් වූ නිසාත් මෙම සිදුවීමෙන් බොහෝ දෙනෙක් කම්පාවට පත්වුනා. මෙම සිද්ධිය සිදුවූ අවස්ථාවේ එම ස්ථානයේ සිටි අය ඉදිරිපත් කළ ඇති පරස්පර විරෝධී ප්‍රකාශ නිසා, මෙම මරණය බොහෝ දෙනෙකුට ප්‍රෙහෙලිකාවක් වුනා.

1 **"පොලිතින් කපද්දි පිහිය ඇයගේ බඩේ ඇනුනා"**
- ඇයගේ මව

2 **"අපි බැනපු නිසා මේකි පිහියෙන් ඇන ගත්තා"**
- ඇයගේ ලොකු අම්මා

( කැපුම් තුවාල දෙකක් උදරයේ ඇති බව මරණ පරීක්ෂණ වාර්තාවේ සදහන් වේ)

3 **"අනේ චන්දන අයියේ..අනේ චන්දන අයියේ.. දැන්වත් එන්න කෝ..."**
- කෑගසීම ඇයගේ සොයුරා

(සිද්ධිය සිදුවූ අවස්ථාවේ ඔහු නිදා සිටි නිසා කිසිවක් නොදන්නා බව ඔහු පසුව පවසා තිබේ)

4 **"විලාපයක හඩක් ඇසී ගෙදරට යන විට ඇය කිසොල්මනේ බිම වැතිර් සිටියා. බිම හෝදල වගේ තිබුනේ. තුවාලෙ හැටියට බිම එතරම් ලේ තිබුනේ නැහැ. ඒ අයට ඇයව රෝහලකට ගෙනියන්න එතරම් උනන්දුවක් තිබුනේ නැහැ."**
- අසල්වාසී ඥාතිවරියක්

එකට එකක් පරස්පර මෙම ප්‍රකාශයන් හා සිදුවීම් නිසාත්, මෙම සිද්ධිය වන අවස්ථාවේ නිවසේ සිටි අය ක්‍රියාත්මක වූ ආකාරයත්, පිළිබඳව බරපතල සැක බොහෝ දෙනෙකුට ඇති වුනා. එමෙන්ම ඉෂාරා ඒ වන විට මුහුණ දී තිබූ ගැටළු පිළිබඳවත් ප්‍රදේශයේ දේවස්ථානයේ පියතුමා වෙත හා පාසැලේ සමහර ගුරුවරුන් හා තම හිතවතුන් සමගත් ප්‍රකාශකර තිබූ නිසාත්, මෙම සිද්ධිය පිටුපස යම් අභිරහසක් ඇති බවට සැක කළ ගම්වාසීන් ඉෂාරාගේ මරණය සම්බන්ධව යුක්තිය හා සාධාරණත්වය ඉල්ලා කටයුතු කිරීමට පෙළ ගැසුනා.

**පළමු රාජකාරිය වුයේ සාධාරණ මරණ පරීක්ෂණයක් ඉල්ලා සිටීම...**

මීගමුව රෝහලේ අධිකරණ වෛද්‍යවරයා ප්‍රකාශකර තිබුනේ මෙම මරණය තියුනු ආයුධයකින් සිදුවූ තුවාල මත හදිසි අනතුරකින් සිදුවූ මරණයක් බවයි. මීට එරෙහිව වහා ක්‍රියාත්මක වූ ගම්වාසීන්, සෑහෙන වෙහෙසකින් පසු නැවත මරණ පරීක්ෂණයක් වෙනත් ස්ථානකයදී පවත්වන ලෙස ඉල්ලා අධිකරණ නියෝගයක් ලබා ගනු ලැබුවා. එම දෙවැනි පරීක්ෂණය කොළඹ දී පැවැත්වූ අතර මේ වන විට එම වාර්තාව අධිරකරණය වෙත ලැබී තිබේ. එහි හදිසි අනතුරකින් සිදුවූ මරණයක් බව සදහන් වී නැත. අධිකරණ නියෝගයක් ලබා ගැනීමත්, නැවතත් දේහය ගොඩ ගැනීමත්, නැවතත් මරණ පරීක්ෂණයක් පැවැත්වීමත්, මේ සම්බන්ධව අධිකරණයේ නඩු කටයුත්තක් ගොණුවී තිබීමත් යුක්තිය ඉල්ලා සිටි තල්දෙක ගම්වාසීන්ට ලැබුනු මූලික ජයග්‍රහණයන්ය.

මෙම කටයුත්තේදී ගම්වාසීන් ඇරුණුකොට ස්වේච්ඡාවෙන් මේ සම්බන්ධව කටයුතු කිරීමට ඉදිරිපත්වූ නීතිඥ මහතුන් කළ සේවය පැසසිය යුතුය.

මේ වන විට අවසන්වී ඇත්තේ එක් පියවරක් පමණි. තවත් පියවර රාශියක් තැබිය යුතුය. මේ සදහා ඔබගේ ශක්තිය සහයෝගය අපට ඉතා අවශ්‍යය වී තිබේ. කාළය, මුදල් වැයකරමින් ජීවිත අවධානමක් ගනිමින් අහිංසක දැරියකගේ මරණය සම්බන්ධව යුක්තිය ඉල්ලා පිරිසක් සාමුහිකව ක්‍රියාත්මක වීමේ ප්‍රතිඵලය දැන් තල්දෙක ගම්වාසීන්ට ලැබී තිබේ.

මෙම සිද්ධියේ දී ප්‍රදේශවාසීන් සාමුහිකව හා ධෛරයමත්ව ගත් ක්‍රියාමාර්ගයන් නිසා යට ගැසෙන්නට ගිය අපරාධයක් එලිදරව් වෙමින් තිබේ. යුක්තිය හා සාධාරණත්වය වෙනුවෙන් තම කාලය, ශ්‍රමය, සහ ජීවිත අවධානම රැගෙන ක්‍රියාත්මක වූ තල්දෙක ප්‍රදේශයේ එම මානව හිමිකම් ක්‍රියාකාරිකයන්ට අපගේ ගෞරවය හිමිවිය යුතුය.

එමෙන්ම, මීට මැදිහත් වූ එම පිරිස් තම අයිතිවාසිකම් පිළිබඳවත්, පවතින නීතිය පිළිබදවත් දැනුවත් වෙමින් සිටී. මෙම සිදුවීම පමණක් නොව ප්‍රදේශයේ සිදුවන ඕනෑම අකටයුත්තක් වෙනුවෙන් ක්‍රියාත්මක වීමට ද මේ පිළබඳව උනන්දු වෙනත් අය දැනුවත් කිරීමටද සුදානමින් සිටී. නීති විරෝධී අයුක්ති සගත සිදුවීමකදී කරබාගෙන, නිහඬව නොසිට ඒ වෙනුවෙන් නැගී සිටීමට තල්දෙක ගම්වාසීන් දැක්වූ උනන්දුව අප සැමට ආදර්ශයකි.

ඔබත් මේ පිළිබඳව දැනුවත්වීමට හෝ සහයෝගය දැක්වීමට කැමැත්තේ නම් වෙන්නප්පුව, තල්දෙක ගොඩනගා ඇති මානව හිමිකම් එකතුව සමග සම්බන්ධවී දැනුම අවබෝධය ලබා ගනිමින් ඉදිරියේ ඇතිවන ඕනෑම අයුක්ති සහගත සිදුවීම්කදී ඊට එරෙහිව ක්‍රියාත්මක වී සාමුහික ක්‍රියා මාර්ගයන් තුළින් ජයග්‍රහණ ලබා ගනීමට පෙළ ගැසෙමු.

**වෙන්නප්පුව මානව හිමිකම් ඒකකය**

තල්දෙක,

වෙන්නප්පුව

**වැඩි විස්තර සඳහා**
**Rifgt to Life** මානව හිමිකම් මධ්‍යස්ථානය, නො. 555, කොළඹ පාර, කටුනායක
දුරකතන 031 4870308